# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. MTR/B/MaliPS/05/2021/87

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2022 ජූනි 20 දින

සභාපති

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව

**මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(I) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2021 දෙසැම්බර් 31 දිනට මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

Scanned with CamScanner

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂය අවසානයට සකස් කර තිබූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ මුළු වත්කම්වල වටිනාකම රු.440,666,037 ක් වූ අතර මුළු හිමිකම් හා වගකීම්වල වටිනාකම රු.438,174,291 ක් වූයෙන් රු.2,491,746 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ii) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු විවිධ වියදම් රු.301,952 ක් වෙනුවෙන් විවිධ ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලස්වා නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේදී ගොඩනැගිලි වැඩි දියුණු කිරීම සඳහා දරන ලද රු.314,110 ක වියදම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(iv) සභාව සතු සියලු ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම යාවත්කාලීනව තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(v) සමාලෝචිත වර්ෂය අවසානයට පිළියෙල කර තිබූ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අයිතම 05 කට අදාලව මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශයේ හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සංඛ්‍යා අතර රු.119,689,160 ක වෙනසක් නිරීක්ෂණය විය.

(vi) සමාලෝචිත වර්ෂය තුළ සභාව සතු දේපළ සංවර්ධනය කිරීම සඳහා වැය කර තිබූ රු.3,378,526 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(vii) ඉකුත් වර්ෂයේ රු.459,304 ක ණයගැති ප්‍රතිපාදන සලස්වා තිබූ වෙළෙඳගොඩ ලුණුගොඩ පාර පැතිබැම්ම ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තයට අදාලව ලැබී තිබූ රු.291,115 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.



Scanned with CamScanner

(viii) සමාලෝචිත වර්ෂයේදී ඉකුත් වර්ෂවලට අදාලව නිරවුල් කරන ලද කර්මාන්ත ණයහිමියන් රු.781,087 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ix) ඉකුත් වර්ෂයේ රු.480,270 ක බිල්පත් වටිනාකමට වැඩ අවසන් කර තිබූ පාතේගම කොනේගෙදරවත්ත පාර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට අදාලව රු.437,643 ක ප්‍රතිපාදන ලැබීමෙන් පසු තවදුරටත් ලැබිය යුතුව පැවති රු.48,627 ක මුදල සඳහා ණයගැති ප්‍රතිපාදන සලස්වා නොතිබුණි.

(x) සමාලෝචිත වර්ෂය අවසානයට රජගෙවත්ත ලෙනාඩ් මහතාගේ නිවස අසල බෝක්කුව ඉදිකිරීම වෙනුවෙන් ගෙවිය යුතු රු.224,249 ක් සඳහා කර්මාන්ත ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලස්වා නොතිබුණි.

(ආ) නොසැසඳූ පාලන ගිණුම්

---------------------------

(i) මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.52,079,096 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර, එකතුව රු. 570,128 ක අසමානතා පැවතුණි.

(ii) මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.46,940,686 ක් වූ ගිණුම් විෂයයන් 07 කට අදාළ ශේෂ හා ඊට අදාළ ලෙජර් ගිණුම් ශේෂ අතර, එකතුව රු.264,557 ක අසමානතා පැවතුණි.

(ඇ) විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා රු.1,426,505 ක් වූ ගිණුම් විෂයක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.



Scanned with CamScanner

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර



Scanned with CamScanner

ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.



Scanned with CamScanner

## 1.6 අනුකූල නොවීම

### 1.6.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනත | |
| (i) 131 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව විසින් මහජන බැංකුවේ පවත්වා ගෙන යනු ලබන සහ ලංකා බැංකුවේ පවත්වා ගෙන යනු ලබන ජංගම ගිණුම් දෙකක එකතුව රු.25,617,342 අතිරික්ත මුදල් ආයෝජනය කිරීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි. |
| (ii) 152 (i) වගන්තිය | පෞද්ගලික ව්‍යාපාර 193 කින් බදු අය කර ගෙන නොතිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) රීති 105 | කිසිඳු වවුචරයක හෝ ගිණුම්වල සඳහන් කිසිවක් මකා දැමීම නොකළ යුතු වුවද මකන තීන්ත භාවිතා කර සභාවේ ගිණුම් පොත්පත් හා ලේඛනවල සටහන් මකා දමා තිබුණි. |

(ii) රීති 164 — සභාවේ ගිණුම් ලියකියවිලි ලේකම් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් දිනපතා පරීක්ෂා කර ඒ බවට කෙටි අත්සන් තබා තහවුරු කළ යුතු වුවත්, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.

(iii) රීති 180 — සභාවේ සේවක ඇප තැබිය යුතු නිලධාරීන් 09 දෙනෙකු විසින් මුදලින් හෝ නිශ්චිත දේපළක් මගින් ඇප තැබීම සිදු කර නොතිබුණි.

(iv) රීති 217 — ඉඩම් හා ගොඩනැගිලි ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

---------------------------

(i) මු.රෙ. 104(3) සහ 104 (4) — සමාලෝචිත වර්ෂයේ ජුනි 22 දින මාතර අකුරැස්ස ප්‍රධාන මාර්ගයේ දම්පැල්ල ගරාජය අසලදී අංක WPPF-7353 දරන කැබ් රථය අනතුරට පත්වීම සම්බන්ධයෙන් ප්‍රාරම්භක හා අවසන් වාර්තාව සකස් කර නොතිබුණි.

(ii) මු.රෙ. 395 (ඇ) — එක් එක් මාසය අවසානයේදී ඇති ගණුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊ ළඟ මාසයේ 15 වැනි දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කළ යුතු වුවත් සභාව විසින් එසේ කටයුතු කර නොතිබුණි.



Scanned with CamScanner

| | | |
|---|---|---|
| (iii) | මු.රෙ. 395 (ඌ) | සභාවේ සියලුම ජංගම ගිණුම්වලට අදාලව ප්‍රධාන මුදල් පොත් යාවත්කාලීන කොට පවත්වා ගෙන යාම හා බැංකු සැසඳුම් පිළියෙල කිරීම ආදී රාජකාරි නිලධාරීන් දෙදෙනෙකු වෙත පැවරීම නොකර එක් නිලධාරියෙකු විසින් සිදු කර තිබුණි. |
| (iv) | මු.රෙ. 685 | මිල ගණන් කැඳවීමකින් තොරව රු.60,500 ක් වටිනා වීදි පහන් උපකරණ ඒකක 35 ක් මිලදී ගෙන තිබුණි. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු වාහන හා යන්ත්‍රෝපකරණ 05 ක ඉන්ධන දහන පරීක්ෂාව නියමිත කාලය තුළ සිදු කර නොතිබුණි. |

1.6.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ලැබිය යුතු ගිණුම්

--------------------

සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව 86,079,341ක් වූ විවිධ ණයගැති ශේෂය තුළ වර්ෂ 03 ක කාලයක් ඉක්ම වූ එකතුව රු3,772,793 ක ශේෂ ඇතුළත්ව තිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

--------------------

සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.44,883,095 ක් වූ කර්මාන්ත හා විවිධ සැපයුම් ණයහිමි ශේෂය තුළ වර්ෂ 03 ක කාලය ඉක්ම වූ එකතුව රු.1,683,635 ක ශේෂ ඇතුළත්ව තිබුණි.



Scanned with CamScanner

2. මූල්‍ය සමාලෝචනය

--------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ පුනරාවර්තන ආදායම රු.9,740,481 ක් වූ අතර, ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.1,822,688 ක් විය.

2.2 මූල්‍ය පාලනය

--------------

2.2.1 අක්‍රිය බැංකු ගිණුම්

---------------------

සභාව විසින් මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන අංක 117-1-001-8-7906575 දරන ජංගම ගිණුම දීර්ඝ කාලයක් තිස්සේ අක්‍රියව පැවතුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,000ක ශේෂයක් පැවතුණි.



Scanned with CamScanner

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2021 | | | | 2020 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 3,934,500 | 993,730 | 942,960 | 175,722 | 2,340,500 | 703,086 | 663,132 | 124,952 |
| කුලී | 6,721,000 | 2,467,485 | 2,155,375 | 826,289 | 8,946,100 | 3,976,640 | 3,609,736 | 514,179 |
| බලපත්‍ර ගාස්තු | 777,000 | 991,425 | 902,425 | 227,000 | 654,000 | 977,900 | 927,800 | 138,000 |
| වෙනත් ආදායම් | 25,864,400 | 25,668,375 | 27,051,441 | 44,437,824 | 27,059,300 | 5,603,905 | 9,551,182 | 45,820,890 |
| | 37,296,900 | 30,121,015 | 31,052,201 | 45,666,835 | 38,999,900 | 11,261,531 | 14,751,850 | 46,598,021 |

### 2.3.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂය තුළ ඇස්තමේන්තුගත ආදායම රු.37,296,900 ක් විය. සමාලෝචිත වර්ෂයේ ආරම්භයට තිබූ රු.46,598,021ක හිඟ මුදල හා බිල් කිරීම් රු.30,121,015ක් සමඟ රු.76,719,036 ක් අයවීමට තිබූ අතර වර්ෂය තුලදී මුළු අයවීම් රු.31,052,201ක් වීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අය විය යුතු හිඟ මුදල රු.45,666,835 ක් විය.

### 2.3.3 වරිපනම්

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ වරිපනම් ශේෂය රු.116,451 ක් වූ අතර, රු.254,949 ක් වූ වර්ෂයේ බිල් කිරීම් සමඟ රු.371,400 ක් අය විය යුතුව තිබුණි. වර්ෂය තුලදී මුළු අයවීම රු.205,552 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.165,848 ක හිඟ ශේෂයක් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් ඒකක සංඛ්‍යාව 421 ක් වූ අතර එයින් වරිපනම් ඒකක 161 කින් රු.165,848 ක හිඟ ශේෂයක් පැවතුණි. විස්තර පහත දැක්වේ.

| හිඟ ආදායම් පරාසය | වරිපනම් ඒකක සංඛ්‍යාව |
|---|---|
| රු.10,000 ට වැඩි | 01 |
| රු.5,000 ට වැඩි | 03 |
| රු. 2,000 ට වැඩි | 18 |
| රු.1,000 ට වැඩි | 36 |
| රු.1,000 ට අඩු | 103 |
| | 161 |



Scanned with CamScanner

හිඟ වරිපනම් ඒකක වෙනුවෙන් රතු නිවේදන යැවීම, දේපළ තහනම් කිරීම හා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ඇ) පසුගිය වර්ෂ 03 ක හිඟ වරිපනම් ආදායම් අයවීමේ සාමාන්‍ය ප්‍රතිශතය සියයට 35 ක් ව පැවති අතර හිඟ ආදායම් වැඩිවීමේ ප්‍රවනතාවයක් නිරීක්ෂණය වේ.

| වර්ෂය | හිඟ ආදායම | රැස් කළ ආදායම | හිඟ ආදායමෙන් අයවීම් ප්‍රතිශතය |
|---|---|---|---|
| | රු. | රු. | % |
| 2018.12.31 | 89,877 | 39,873 | 44 |
| 2019.12.31 | 75,807 | 23,146 | 31 |
| 2020.12.31 | 116,451 | 33,403 | 29 |

(ඈ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 134 වන වගන්තිය ප්‍රකාර සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශයන් හඳුනාගෙන, වරිපනම් දේපළ තක්සේරු කර වරිපනම් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.3.4 කුලී

#### කඩකුලී

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ කඩ කුලී ශේෂය රු.415,080 ක් වූ අතර රු.1,758,900 ක් වූ වර්ෂයේ බිල් කිරීම් සමඟ රු.2,173,980 ක් අය විය යුතුව තිබුණි. වර්ෂය තුලදී අයවීම් රු.1,447,040 ක් වීම නිසා වර්ෂය අවසානයට රු.726,940 ක හිඟ ශේෂයක් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානය වන විට සභාව සතු කඩ කාමර 42 ක් බදු දී තිබූ අතර කඩ කාමර 29 කින් රු.726,940 ක හිඟ ආදායමක් පැවතුණි. විස්තර පහත දැක්වේ.



Scanned with CamScanner

| නිහ ආදායම් පරාසය | බදුකරුවන් සංඛ්‍යාව |
|---|---|
| රු.50,000 ට වැඩි | 04 |
| රු.25,000 ට වැඩි | 10 |
| රු.12,000 ට වැඩි | 03 |
| රු.6,000 ට වැඩි | 07 |
| රු.6,000 ට අඩු | 05 |
| | 29 |

(ඇ) සභාව සතු මාලිම්බඩ වෙළෙඳ සංකීර්ණයේ කඩ කාමර 06 ක් බදුකරුවන් විසින් ප්‍රයෝජනයට නොගෙන වසා දමා තිබුණි.

### 2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් නිලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට උසාවි දඩ රු.1,820,296 ක් හා මුද්දර ගාස්තු රු.42,122,056 ක් අය විය යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශිය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.



Scanned with CamScanner

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

---

(i) සභා බල ප්‍රදේශය තුළ දෛනිකව එක්රැස් කරන ටොන් එකකට ආසන්න වූ කසළ ප්‍රමාණය දිරාපත් වන හා නොදිරන කසළ ලෙස වර්ගීකරණය කිරීමෙන් තොරව එක් රැස් කර කසළ අංගනය වෙත ප්‍රවාහනය කර, කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීම සඳහා දිරන හා නොදිරන කසළ නැවත වර්ගීකරණය කිරීම සඳහා ඒ වෙනුවෙන් සභාවේ කම්කරුවන් යොදවා තිබුණි.

(ii) නොදිරන කසළ බැහැර කර පස්වලින් යට කිරීම සිදු කර තිබුණු අතර පරිසර හිතකාමී ලෙස නොදිරන කසළ ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

---

(අ) වර්ෂ ගණනාවක සිට ඉදිරියට එමින් පවතින දැන්වීම් පුවරු ගාස්තු රු.256,895 ක් සමාලෝචිත වර්ෂයේදී ද අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2016 වර්ෂයේ සභාව සතු ගල්රෝල කුලියට දීමෙන් පෞද්ගලික පාර්ශවයන්ගෙන් අයවිය යුතුව තිබූ රු.23,100 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අය කර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාව සතු කඩ කාමර 07 ක් සඳහා විදුලි සැපයුම ලබා නොදීම නිසා සමාලෝචිත වර්ෂය තුළ එම කඩ කාමර මාස 05 ත් 10 ත් අතර කාලසීමාවක් වසා තැබීම හේතුවෙන් රු.174,500 ක කඩ කුලී ආදායමක් සභාවට අහිමි වී තිබුණි.



Scanned with CamScanner

3.3 මානව සම්පත් කළමනාකරණය

(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත

සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 12 ක් සම්පූර්ණ කර ගැනීමටත්, අතිරික්තව පවතින තනතුරු 01 ක් විධිමත් කර ගැනීමටත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ස්ථිර කාර්යමණ්ඩලය වෙනුවෙන් රු.22,636,730 ක වැටුප් ගෙවා තිබූ අතර ප්‍රතිපූර්ණය වී තිබුණේ රු.21,313,696 ක් පමණක් වූයෙන් රු.823,034 ක් ප්‍රතිපූර්ණය වී නොතිබුණි.

(ඇ) වර්ෂ ගණනාවක සිට ඉදිරියට එමින් පවතින එකතුව රු.313,456 ක හිඟ අර්ථ සාධක අධිහාර හා ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ ශේෂ අදාල පාර්ශවයන්ගෙන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සේවක ණය

සේවය හැරගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් 07 දෙනකුගෙන් අයවිය යුතු එකතුව රු.334,153 ක් වූ ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අය කර ගෙන නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට සේවකයෙකුගෙන් සභාවට අය විය යුතු රු.16,250 ක ණය ශේෂය ලැබිය යුතු ණයගැතියන් යටතේ දක්වා තිබූ අතර එම ශේෂය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) සභාවේ සේවයේ නියුක්ත වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් 07 දෙනෙකු හා සෞඛ්‍ය කම්කරුවන් දෙදෙනෙකු තනතුරට අදාල නොවන රාජකාරිවල යොදවා තිබුණි.



Scanned with CamScanner

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාරව සංචාරක මණ්ඩලයේ අනුමත හෝටල්වල ලැබීම්වලින් 1%ක ගාස්තුවක් අය කළ යුතු වුවද සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි අංක SLTDA/SQA/BAN/00658 දරන එක්තරා සංචාරක බංගලාවකින් සමාලෝචිත වර්ෂයේ මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයට අදාල බලපත්‍ර ගාස්තු අය කර ගෙන නොතිබුණි.

(ආ) 2016 - 2021 අතර කාලපරිච්ඡේදය තුළ සභාවට ඉදිරිපත් කරන ලද ගොඩනැඟිලි අයදුම්පත් විවිධ හේතූන් මත අනුමත කර නොතිබූ අතර එම ගොඩනැඟිලි අයදුම්පත් පිළිබඳව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී ගොඩනැඟිලි අයදුම්පත් 06 කට අදාලව ගොඩනැඟිලි ඉදිකර අවසන් කර හෝ ඉදිකරමින් තිබුණි. තවද නාගරික බල ප්‍රදේශයේ සංවර්ධන බලපත්‍ර ලබා ගැනීමකින් තොරව ගොඩනැඟිලි 07 ක් ඉදිකර තිබූ අතර මෙම අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග/ රෙගුලාසි ඇතුළත් 2021 ජූලි 08 දිනැති අංක 2235/54 දරන ගැසට් නිවේදනයේ 02 වන උපලේඛනය ප්‍රකාරව කටයුතු කර රු.1,927,376 ක ගාස්තු අය කර ඉදිකිරීම් විධිමත් කිරීමට හෝ ඉවත් කිරීමට කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ අංක PR/01/01 හා 2010 අගෝස්තු 17 දින දරන චක්‍රලේඛය ප්‍රකාරව වීථි පහන් ස්ථාපනය නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ වීථි පහන් වෙනුවෙන් දරන ලද රු.436,350 ක වියදම් විදුලිබල මණ්ඩලයෙන් ප්‍රතිපූර්ණය වී නොතිබුණි.



Scanned with CamScanner

127

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ අංක දපස/15 හා 2007 මාර්තු 19 දිනැති උපදෙස් ලිපිය ප්‍රකාරව සෑම දේපළක්ම වැට මායිම් දමා අනවසරයෙන් ඇතුළු වීමට නොහැකි වන සේ පවත්වා ගත යුතු වුවද සභාව සතු ඉඩම් 23 ක් සම්බන්ධව මායිම් ලකුණු කර ආරක්ෂා කර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

### 3.5.2 පවරා නොගත් වත්කම්

සභාව විසින් පරිහරණය කරනු ලබන ඉඩම් 09 කට අදාළව හිමිකම් ඔප්පු ද, ඉඩම් 06 කට අදාලව පිඹුරුපත් ද සභාව සතුව නොතිබුණි.

### 3.5.3 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු එක් වාහනයක් හා යන්ත්‍ර 02 ක් නිශ්ක්‍රියව පැවති අතර ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) සභාව සතු ඉඩම් 14 ක් හා ගොඩනැගිලි 02 ක් ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව පැවතුණි.

## 3.6 අවිධිමත් ගණුදෙනු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) වාහන හා යන්ත්‍රෝපකරණ 05 ක් අලුත්වැඩියාවට යොමු කළ බව දක්වමින් වාහන හා යන්ත්‍රෝපකරණ 09 ක් කුලියට ලබා ගැනීම වෙනුවෙන් රු.369,175 ක මුදලක් වැය කර තිබුණද, එම දිනයන්හි සභාව සතු වාහනද ධාවනය කර තිබූ අතර එම කාලපරිච්ඡේදය තුළ ඉටු කළ රාජකාරි පිළිබඳව ධාවන සටහන්වල වාර්තා කර නොතිබුණි.



Scanned with CamScanner

(ආ) සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 09 ක දී සභාව සතු අංක PF – 7353 දරන කැබ් රථය අළුත්වැඩියාවට යොමු කළ බව සඳහන් කරමින් කුලී පදනම මත පෞද්ගලික පාර්ශවයන්ගෙන් මෝටර් රථ ලබා ගැනීම වෙනුවෙන් රු.135,835 ක් සභා අරමුදලින් වැය කර තිබූ අතර එම රථ යොදවා ඉටු කළ රාජකාරි පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොවුණි.

3.7 ප්‍රසම්පාදනය

-------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3:4:1 (අ) (iii) ප්‍රකාරව වෙළෙඳපොළ මිල සැඳහුම් ක්‍රමය යටතේ මිල කැඳවීමකින් තොරව අවස්ථා 07 ක දී ත්‍රී රෝද රථ හා ට්‍රැක්ටර් 02 ක් කුලියට ලබා ගෙන රු.233,340 ක් සභා අරමුදලින් දරා තිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3:6:1 ප්‍රකාරව කටයුතු නොකර මුල් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර සය මසක කාලයක් ඉකුත් වී තිබියදීත් ඒ මත පදනම්ව අවස්ථා 06 ක දී වාහන කුලියට ලබා ගෙන සභා අරමුදලින් රු.91,580 ක වියදමක් දරා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී පෙරටු කාර්යාලය සඳහා ලදුපත් 10,000 ක් මුද්‍රණය කිරීම සඳහා සැපයුම්කරුවෙකු තෝරා ගැනීමේදී මාර්තු 25 දින පෞද්ගලික ආයතන 04 කින් කැඳවන ලද මිල ගණන් අතුරින් ඒකකයක් සඳහා රු.4.95 ක අවම මිලක් ඉදිරිපත් කර තිබූ ආයතනයේ මිල කියුම අප්‍රේල් 06 දිනත්, අනෙකුත් ආයතනවල මිල කියුම් මැයි 11 දිනත් විවෘත කර තිබුණි. මැයි 11 දින පැවති මුදල් කමිටුව වෙත ඒකකයක් සඳහා රු.4.95 ක අවම මිලක් ඉදිරිපත් කර තිබූ ආයතනයේ මිල කියුම ඉදිරිපත් නොකර ඊට වැඩි මිලක් ඉදිරිපත් කර තිබූ ආයතනයක් වෙතින් එකක් රු.8.30 ක් බැගින් මිලදී ගැනීමට අනුමැතිය ලබා දීම නිසා රු. 39,500 ක අමතර වියදමක් දරා තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේ සැප්තැම්බර් 29 හා සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් 09 අතර කාලසීමාව තුලදී අවස්ථා 05 කදී රු.509,250 ක් වැය කර එක්තරා පෞද්ගලික ආයතනයකින් වොට් 12.5 LED බල්බ 1050 ක් මිලදී ගෙන තිබූ අතර, ඊට අදාලව මිල ගණන් කැඳවීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.2 (අ) හා 3.6.1 විධිවිධානයන් අනුව කටයුතු කර නොතිබුණි.



Scanned with CamScanner

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ සභාව විසින් රු.196,000 ක් වැය කර මිලදී ගෙන තිබූ Epson LQ 2190 Dot Matrix වර්ගයේ ප්‍රින්ටරයක් මිලදී ගැනීමට අදාලව මිල ගණන් කැඳවීමේදී සැපයුම්කරුවන් වෙත අපේක්ෂිත පිරිවිතර ඉදිරිපත් කර නොතිබුණු අතර 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.5 (අ) හා (ආ) සහ 6.3.6 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

3.8 කොන්ත්‍රාත් පරිපාලනය

------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2020 වර්ෂයේ සපිරි ගමක් ජනතා සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන හා සමාලෝචිත වර්ෂයේ සභා අරමුදල් යටතේ ක්‍රියාත්මක කර තිබූ කොන්ක්‍රීට් කාණු සැකසීමේ කර්මාන්තයක් හා පැති බැම් ඉදිකිරීමේ කර්මාන්ත 05 කට අදාලව පදම් කළ ලෑලි (Plywood) පුවරු භාවිතා කර හැඩයම් සැකසීම සඳහා ගෙවීම් කිරීමේදී සමාන වැඩ විස්තරයක් සහිත රේටයක් ලෙස දකුණු පළාත් ඉංජිනේරු සේවා කාර්යාලය විසින් CT- 036 යටතේ හඳුන්වා දුන් රු.841 ක රේටය වෙනුවට, දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අඟල් 01 (55 mm) ඝනකමට ඉරන ලද දෙවන පන්තියේ දැව ලෑලි භාවිතා කර හැඩයම් සැකසීම සඳහා ST – 057 යටතේ හඳුන්වා දී තිබූ රු. 1,108 රේටය භාවිතා කිරීම නිසා වර්ග මීටරයකට රු.267 බැගින් වර්ගමීටර් 592.83 ක් සඳහා රු.158,285 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) 2020 වර්ෂයේ සපිරි ගමක් ජනතා සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ කැරන්තොල්ල පාර කාණු පද්ධතිය ඉදිකිරීමේදී මීටර් 40.4 ක් දිගින් යුතු කොටසේ කාණු බැම්ම මායිම් තාප්පයකට සම්බන්ධ කර තිබූ බැවින් වර්ග මීටර් 14 ක ප්‍රමාණයක හැඩයම් භාවිතා කර නොතිබුණු නමුත් එම ප්‍රමාණයද ඇතුළත්ව රු.15,512 ක් ඉටු නොකළ වැඩ වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) 2020 වර්ෂයේ සපිරි ගමක් ජනතා සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කර තිබූ ගල්පමුණ ආදම්වත්ත මාර්ගය රංජි මහතාගේ නිවස අසල සිට කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට අදාලව ඉදිකළ මාර්ගයේ දිග මීටර් 178 ක් හා පළල මීටර් 2.4 ක් ලෙස මිනුම් පත්‍රයේ ඇතුළත් කර තිබූ නමුත් ඉදි කර තිබූ මාර්ගයේ මුළු දිග මීටර් 161.7 ක් වූ බැවින් මීටර් 16.7 ක් සඳහා කොන්ක්‍රීට් ඝන මීටර් 5.01 ක් වෙනුවෙන් රු.86,312 ක මුදලක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි.



Scanned with CamScanner

4. ශිණුම්කටයුතුභාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත විස්තර දැක්වෙන පරිදි සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(අ) ආදායම් විෂයයන් 02 ක හිතකර විචලනයන්ගේ එකතුව රු.495,643 ක් වූ අතර, එම අගයන් සියයට 18 සිට සියයට 25 අතර පරාසයක පැවතුණි.

(ආ) වියදම් විෂයයන් 05 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු.8,368,751 ක් වූ අතර, එම අගයන් සියයට 02 සිට සියයට 60 දක්වා පරාසයක පැවතුණි.

(ඇ) වියදම් විෂයන් 05 ක අයවැයගත වියදම සහ තත්‍ය වියදම අතර එකතුව රු.10,513,966 ක වාසිදායක විචලනයක් නිරීක්ෂණය වූ අතර, එම අගය සියයට 08 සිට සියයට 61 දක්වා පරාසයක පැවතුණි.

(ඈ) වියදම් විෂයක අහිතකර විචලනය රු.89,559 ක් වූ අතර , එම අගය සියයට 02 ක් ව පැවතුණි.

කේ.එච්.යූ.ඩී. සරත් කුමාර
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.



Scanned with CamScanner